8866

•සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

## 11 ශ්‍රේණිය
## භූගෝල විද්‍යාව - I පත්‍රය

නම/විභාග අංකය :-- .................................................................................. කාලය : පැය 01 යි.

❖ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

❖ අංක 01 සිට 10 තෙක් ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.

(1) සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක අතර ජීවීන් සහිත එකම ග්‍රහලෝකය වන්නේ ............................ ය. (අඟහරුය / බුධය/ පෘථිවිය )

(2) පෘථිවියේ මිනිසාගේ ක්‍රියාකාරකම් වලින් වැඩි ප්‍රමාණයක් සිදු වන්නේ ............................ තුළය. (ජලගෝලය/ ශිලා ගෝලය / වායුගෝලය)

(3) පෘථිවි .... ............................ සහ ප්‍රාවරණයේ ඉහළ කොටස ඇතුළත් කලාපය ශිලා ගෝලය ලෙස හැඳින්වේ. (කබොල / හරය / පහළ ප්‍රාවරණය)

(4) පෘථිවි ශිලාගෝලය එකිනෙකට සාපේක්ෂව ඉතා සෙමෙන් චලනය වෙමින් පවතින ............................ රාශියකින් සමන්විත වේ. (නැමි කඳු / භූ තැටි / භූ චලන)

(5) ජපානය පිහිටා ඇත්තේ ............................ භූ තැටියේ ය. (යුරෝෂියානු / අප්‍රිකානු / කැරිබියානු)

(6) පෘථිවි ප්‍රාවරණය හා හරය වෙන් කරන සීමාව ............................ අසන්තතියයි. (මොහොරොවිසික් / ගුටෙන්බර්ග් / ලෙහ්මන්)

(7) සමාන උසකින් යුතු ස්ථාන යා කර අඳිනු ලබන රේඛා ............................ ලෙස හැඳින්වේ. (සමෝච්ච රේඛා / සමෝෂ්ණ රේඛා / සම පීඩන රේඛා)

(8) පෘථිවියේ අන්තර්ගත තොරතුරු පැතලි තලයක් මත නිරූපණය කරන විශ්ව ප්‍රකාශන මාධ්‍ය ............................ ලෙස හඳුන්වයි. (සිතියම / ප්‍රස්ථාරය / චිත්‍රය)

(9) අම්බලන්ගොඩ සිට දෙවුන්දර දක්වා වෙරළ තීරයේත්, යාපන අර්ධද්වීපය හා වෙරළ තීරයේත්, බහුලවම දක්නට ලැබෙන ඛනිජ වර්ගය වන්නේ ............................ ය. (බෝල මැටි / හිරිගල් / පිගන් මැටි)

(10) සාක් රටවල් අතර ඉහළම මානුෂ සංවර්ධනයක් සහිත රට ............................ ය. (ඉන්දියාව / ශ්‍රී ලංකාව / මාලදිවයින)

❖ අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා එය නිවැරදි නම් 'නි' යන්න වටා ද වැරදි නම් 'වැ' යන්න වටා ද රවුමක් අඳින්න.

(11) පාංශු පැතිකඩක A මහල නිර්මාණය වී ඇත්තේ නොදිරූ පැළෑටි විශේෂ හා සත්ව කොටස් ද, අර්ධ වශයෙන් දිරාපත් වූ ද්‍රව්‍යවල එකතුවෙනි. (නි /වැ)

(12) ආග්නේය පාෂාණ, ආක්‍රාන්ත ආග්නේය පාෂාණ හා නිෂ්ක්‍රාන්ත ආග්නේය පාෂාණ වශයෙන් කොටස් 2ට බෙදේ. (නි /වැ)

(13) ලෝකයේ මුළු ජන සංඛ්‍යාවෙන් 76%ක් ආසියා මහාද්වීපයේ වාසය කරයි. (නි /වැ)

(14) මූර්ත දළ ජාතික නිෂ්පාදිතය, සංවර්ධනය මැනීමේ නූතන මිනුමක් ලෙස භාවිත කරයි. (නි /වැ)

(15) 1:50,000 මෙට්‍රික් සිතියම්වල ඉහළ වට තීරුවේ, නම, සිතියම් වර්ගය හා පත්‍ර අංකය සටහන් කර ඇත. (නි /වැ)

❖ **අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවල 'අ' හා 'ආ' යනුවෙන් තීරු දෙකක් දැක්වේ. ඒවා සම්බන්ධතාව අනුව ගැළපූ විට නිවැරදි පිළිතුරට හිමි අංකය තිත් ඉර මත ලියා දක්වන්න.**

(16) පහත 'අ' තීරුවේ සඳහන් භූ තැට්වලට අයත් රටවල් 'ආ' තීරුවෙන් ගළපා නිවැරදි පිළිතුර තිත් ඉර මත ලියන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. දකුණු ඇමරිකානු තැට්ය | A මාලදිවයින |
| 2. ඉන්දු ඕස්ට්‍රේලියානු තැට්ය | B බ්‍රසීලය |
| 3. අප්‍රිකානු තැට්ය | C ප්‍රංශය |
| | D මැඩගස්කරය |

(1) A, B,C (2) B, A, D (3) B, C, A (4) D, C, A (..........)

(17) පහත 'අ' තීරුවේ වායු ස්තර වලට අදාළ සිදුවීම් 'ආ' තීරුවෙන් තෝරා ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. පරිවර්ති ගෝලය | A සුපර් සොනික් ජෙට් යානා පියාසර කරයි. |
| 2. මෙසෝ ගෝලය | B ජල වාෂ්ප, වළාකුළු, දූවිලි අංශු නොමැත. |
| 3. තාප ගෝලය | C වාර්ෂණය, උෂ්ණත්වය, පීඩනය ආදී කාලගුණික සංසිද්ධි ඇති වේ. |
| | D උෂ්ණත්වය අධිකම ස්තරය වේ. |

(1) A, D, C (2) A, B, C (3) B, C, D (4) C, B, D (..........)

(18) 'අ' තීරුවේ ඇති මහද්වීපවලට අදාළ ගංගා 'ආ' තීරුව හා ගැළපූ විට පිළිතුර වනුයේ,

| 'අ' | 'ආ' |
|---|---|
| 1. ඕස්ට්‍රේලියාව | A නයිජර් |
| 2. දකුණු ඇමරිකාව | B යූරල් |
| 3. අප්‍රිකාව | C ඇමසන් |
| | D මරේ ඩාලිං |

(1) A, D, B (2) B, C, D (3) D, C, A (4) D, A, B (..........)

(19) පහත සඳහන් වගාවන්ට අදාළ පර්යේෂණ මධ්‍යස්ථාන 'ආ' තීරුවෙන් ගළපා පිළිතුර තෝරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. වී | A බතලගොඩ |
| 2. තේ | B මාතලේ |
| 3. සුළු අපනයන භෝග | C ලුණුවිල |
| | D තලවකැලේ |

(1) A, D, B (2) B, C, D (3) C, D, B (4) D, A, B (..........)

(20) පහත සඳහන් ධීවර කර්මාන්තයට අදාළ මසුන් 'ආ' තීරුවෙන් තෝරා පිළිතුර තිත් ඉර මත ලියන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. කරදිය ධීවර කර්මාන්තය | A කාප්, මස්පෙතියා, ගොඩයා |
| 2. මිරිදිය ධීවර කර්මාන්තය | B තෝරා, මෝරා, කොප්පරා |
| 3. කිවුල්දිය ධීවර කර්මාන්තය | C ඉස්සා, පොකිරිස්සා, කකුළුවා |
| | D ඉස්සා, කෙළවල්ලා, ලූලා |

(1) A, B, C (2) B, A, C (3) B, C, D (4) C, D, A (..........)

❖ **අංක 21 සිට 25 තෙක් ඇති ප්‍රශ්නවලවලට සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

(21) 1 : 50,000 මෙට්‍රික් සිතියමක කි.මී. 7ක් දිග මාර්ගයක් දැක්වීම සඳහා සෙ. මී. ..........................ක් භාවිත කරයි.

(22) පරිසරයේ ඇති මිනිසාගේ පැවැත්මට හා ඔහුගේ ක්‍රියාකාරකම්වලට ප්‍රයෝජනවත් වන දෑ .......................... සම්පත් වේ.


(23) ඉලෙක්ට්‍රෝනික කර්මාන්තය, ලෝහ ආවරණ සෑදීම, තීන්ත, පැන්සල් කූරු වැනි දේ නිපදවීම සඳහා .......................... භාවිතා කරයි.

(24) ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික් අතුරෙන් ග්‍රාමීය ජන සංඛ්‍යාවට වඩා නාගරික ජන සංඛ්‍යාව වැඩි දිස්ත්‍රික්කය වනුයේ .......................... දිස්ත්‍රික්කයයි.

(25) ශ්‍රී ලංකාවට අයත් මුහුදු සීමාව වෙරළේ සිට නාවික සැතපුම් 12 දුරට විහිදෙන සාගර කලාපය හඳුන්වනු ලබන්නේ .......................... මුහුදු ප්‍රදේශය වශයෙනි.

❖ **අංක 26 සිට 28 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා දී ඇති ප්‍රස්තාරය යොදා ගන්න.**

**ලෝකයේ ජනාධිකම නගර 1950, 2000, 2015**





(26) 2015 දී ලෝකයේ ජනාධික ම නගරය .................................. විය.

(27) මෙම ප්‍රස්තාරයට අනුව වසර 2000 දී ජනාධිකතම නගර අතර දෙවන ස්ථානය මෙක්සිකෝ නුවර ලබාගෙන ඇති අතර 2015 වසරේ දී ජනාධිකතම නගර අතර දෙවන ස්ථානය හිමි වූයේ .................................. නගරයටයි.

(28) ප්‍රස්ථාරයට අනුව ටෝකියෝ නගරයේ ජන සංඛ්‍යාව 1950 සිට 2015 දක්වා .................................. වී ඇත.

❖ **29 හා 30 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා දී ඇති ශ්‍රී ලංකා සිතියම යොදා ගන්න.**




(29) ශ්‍රී ලංකා සිතියමේ දැදුරු ඔය දැක්වෙන අක්ෂරය .......................... ය.

(30) ශ්‍රී ලංකාවේ පිඟන් කර්මාන්තය ආශ්‍රිත කෙඹලින් වලට ප්‍රසිද්ධ ස්ථානයක් දැක්වෙන අක්ෂරය .......................... ය.

❖ **අංක 31 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු හතර අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.**

(31) මහද්වීපික කබොල නිර්මාණය වී ඇත්තේ,
(1) සිලිකේට් වලිනි. (2) බැසෝල්ට් පාෂාණ වලිනි
(3) ග්‍රැනයිට් පාෂාණ වලිනි. (4) මැග්නීසියම් වලිනි. (.......)

(32) සුළු අපනයන බෝගයක් වන පැඟිරි ව්‍යාප්ත වී ඇති ප්‍රධාන දිස්ත්‍රික්ක දෙක වන්නේ,
(1) මාතර, හම්බන්තොට (2) මහනුවර, කෑගල්ල
(3) මාතර, මාතලේ (4) නුවරඑළිය, බදුල්ල (.......)

(33) ලෝකයේ තේ වගාව ව්‍යාප්ත වී ඇති අප්‍රිකානු හා ආසියානු රටවල් යුගලය වන්නේ,
(1) චීනය, ආජන්ටිනාව (2) කෙන්යාව, චීනය
(3) චීනය, ඉන්දියාව (4) ආජන්ටිනාව, ශ්‍රී ලංකාව (.......)

(34) ආසියාතික රටවල් වැඩි වශයෙන් පරිභෝජනය කරන ධාන්‍ය වර්ගය වන්නේ,
(1) සහල් ය. (2) තිරිඟු ය.
(3) ඉරිඟු ය. (4) මෙනේරි ය. (.......)

(35) ශ්‍රී ලංකාවේ දැඩි ස්වාභාවික රක්ෂිත ලෙස නම් කොට ඇති ප්‍රදේශ පමණක් දැක්වෙන පිළිතුරු වන්නේ,
(1) හක්ගල, වීරවිල, මාදුරුඔය (2) යාල, කවුඩුල්ල, මින්නේරිය,
(3) විල්පත්තු, සීගිරිය, මදුනාගල (4) හක්ගල, යාල, රිටිගල (.......)

(36) ශ්‍රී ලංකාවේ යාපන අර්ධද්වීපයේ ව්‍යාප්තව ඇති පස් විශේෂය වන්නේ,
(1) රතු කහ පොඩ්සෝල් පස (2) රතු කහ ලැටසෝල් පස
(3) චූර්ණමය නොවූ දුඹුරු පස (4) රතු දුඹුරු පස (.......)

❖ **අංක 37 සිට 39 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන තොරතුරු උපයෝගී කරගන්න.**

A - බෝග විවිධාංගීකරණය
ආදායම් ලැබීමේ අවස්ථා
B - එක් වෛද්‍යවරයෙකු සඳහා වන ජන සංඛ්‍යාව
මාතෘ මරණ
C - අපනයන ආදායම්
දරිද්‍රතාව
D - ප්‍රමිතියෙන් තොර ආහාර
රෝගාතුරභාවය

(37) මෙම අදහස් යුගල අතරින් පළමු වැන්නේ වැඩිවීම දෙවැන්නේ වැඩිවීමට හේතුවන බව කියවෙන ප්‍රකාශ ඇතුළත් වන්නේ කිනම් පිළිතුරේ ද?
(1) A සහ D (2) C සහ D (3) B සහ D (4) B සහ C (.......)

(38) පළමු වැන්නේ වැඩිවීම දෙවැන්නේ අඩුවීමට හේතුවන බව කියවෙන ප්‍රකාශය ඇතුළත් වන්නේ කිනම් පිළිතුරේ ද?
(1) A (2) D (3) C (4) B (.......)

(39) පළමු වැන්නේ වැඩිවීම දෙවැන්නේ වැඩිවීමට හේතු වුවද එය අයපත් ප්‍රතිඵලයක් ගෙන දෙන්නේ කුමන ප්‍රකාශයේ ද?
(1) A (2) B (3) C (4) D (.......)

(40) ලෝකයේ බොහෝ රටවල පරිසර දූෂණය අවම කර ගැනීම සඳහා භාවිත කරන බලශක්ති මූලාශ්‍රය වන්නේ,
(1) පෙට්‍රෝලියම් (2) දර
(3) සූර්ය ශක්තිය (4) කෘෂි අපද්‍රව්‍ය (.......)

(ලකුණු 1x 40 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

## 11 ශ්‍රේණිය

## භූගෝල විද්‍යාව - II පත්‍රය

නම/විභාග අංකය :-- ..........................................................................................

(1) (අ) කොටසට පිළිතුරු සැපයීම සඳහා

(i) ..........................................................................................

(ii) ..........................................................................................

(iii) ..........................................................................................

(iv) ..........................................................................................

(v) ..........................................................................................

(vi) ..........................................................................................

(vii) (A) ..........................................................................................


(B) ..........................................................................................

(C) ..........................................................................................

(viii) ..........................................................................................

10

(අ)




(i)

(ii)


(iii)

(iv)

(v)

5

(ආ)




(i)

(ii)

(iii)

(iv)

(v)

5

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

## 11 ශ්‍රේණිය
## භූගෝල විද්‍යාව - II පත්‍රය

නම/විභාග අංකය :- ........................................................................ කාලය : පැය 02 යි.

- ❖ මෙම ප්‍රශ්න පත්‍රය I, II වශයෙන් කොටස් දෙකකි.
- ❖ I කොටස් පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ), (ආ) සහ (ඉ) කොටස් තුනට ම පිළිතුරු සැපයිය යුතුය.
- ❖ II කොටසින් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතු ය.
- ❖ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

## I කොටස

(1) (අ) ඔබ වෙත සපයා ඇති 1 : 50,000 හු ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කොට ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු දීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය යොදා ගන්න.

★ අංක (i) සිට (vi) දක්වා අසා ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුරු වරහන් තුළින් තෝරන්න.

(i) සිතියමේ A - B වලින් දක්වා ඇති බෑවුම කුමක් ද? (මොහොර බෑවුම/ උත්තල බෑවුම/ අවතල බෑවුම) (ලකුණු 01)

(ii) C වලින් දක්වා ඇත්තේ, (ගල / ගල්වල / හේන) (ලකුණු 01)

(iii) අංක 01න් දක්වා ඇත්තේ කුමක් ද? (රක්ෂිත වන මායිම / වැලි වැටිය / ලඳු කැලෑ) (ලකුණු 01)

(iv) සිතියමේ උසම ත්‍රිකෝණමිතික ස්ථානය වන්නේ, ( K, L, M) (ලකුණු 01)

(v) අංක 03න් දක්වෙන මායිම වන්නේ, (දිස්ත්‍රික්කය / උප දිසාපති කොට්ඨාසය / ග්‍රාම නිලධාරි කොට්ඨාසය) (ලකුණු 01)

(vi) අංක 04න් දැක්වෙන්නේ (ජාල රේඛා කැපී යන ස්ථානයකි / ආක්ෂාංශ හා දේශාංශ කැපී යන ස්ථානයකි / දිශාව දැක්වන ස්ථානයකි) (ලකුණු 01)

(vii) සිතියම් ප්‍රදේශය පිළිබඳ ප්‍රකාශ 3ක් පහත දැක්වේ. ඒවා නිවැරදි නම් 'නි' යන්න ද, වැරදි නම් 'වැ' යන්න ද පිළිතුරු පත්‍රයේ සටහන් කරන්න.

A - සිතියමේ මධ්‍ය ප්‍රදේශයේ පහත් බිම්වල වී වගාව ව්‍යාප්ත වී ඇත. (ලකුණු 01)

B - සිතියමේ බටහිර අර්ධයෙහි ලඳුකැලෑ ව්‍යාප්තියක් දක්නට ඇත. (ලකුණු 01)

C - සිතියමේ උතුරු ප්‍රදේශය උස්බිම් වලින් සමන්විත වේ. (ලකුණු 01)

(viii) උතුරු මායිමෙන් පටන් ගෙන බටහිර මායිමෙන් අවසන් වන B 474 මාර්ගයේ දිග කි. මී. කීය ද?(ලකුණු 01)

(ආ) ඔබට සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කොට පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුර සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබදව දක්වා ඇති තීරුව යොදා ගන්න.

(i) සිතියමේ A, B හා C යන අක්ෂර වලින් අන්දීස් කඳු දැක්වෙන අක්ෂරය කුමක් ද?

(ii) D, E හා F අක්ෂර වලින් දක්වා ඇති දූපත් අතුරෙන් නවසීලන්තය දක්වන අක්ෂරය කුමක් ද?

(iii) G, H හා I යන අක්ෂර වලින් දක්වා ඇති රටවල් තුන අතුරෙන් අප්‍රිකාවේ තේ වගා කරන කෙන්යාව දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iv) K, L, M යන අක්ෂර වලින් යැංසි ගඟ දැක්වෙන අක්ෂරය කුමක් ද?

(v) P, Q හා R අක්ෂර වලින් මකර නිවර්තනය දැක්වෙන අක්ෂරය කුමක් ද? (ලකුණු 05)

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කොට පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුර සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලංකා සිතියමට යාබදව දක්වා ඇති තීරුව උපයෝගී කර ගන්න.

(i) A, B හා C යන අක්ෂර අතුරෙන් ගන්නොරුව කෘෂි පර්යේෂණ ආයතනය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(ii) D, E හා F යන අක්ෂර අතුරෙන් යෝජිත ගල් අඟුරු බලාගාරය වන සාම්පූර් දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iii) G, H හා I යන අක්ෂර අතුරෙන් වවුනියාව දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iv) J, K හා L යන අක්ෂර අතුරෙන් පරන්තන් රසායනික ද්‍රව්‍ය කම්හල දැක්වෙන අක්ෂරය කුමක් ද?

(v) M, N හා P යන අක්ෂර අතුරෙන් දෙවුන්දර තුඩුව දැක්වෙන අක්ෂරය කුමක් ද? (ලකුණු 05)

## II කොටස

(2) (i) පෘථිවි ව්‍යුහයේ ප්‍රධාන ස්තර දෙකක් නම් කරන්න. (ලකුණු 2)


(ii) (a) මිනිසාට වැදගත් පෘථිවි ස්තරය කුමක් ද? (ලකුණු 1)

(b) එම ස්තරය වැදගත් වීමට හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2)

(iii) (a) ජෛව ගෝලයේ ක්‍රියාකාරිත්වය සඳහා බලපාන ප්‍රධාන සාධක 2ක් නම් කරන්න. (ලකුණු 2)

(b) ජෛව ගෝලයේ සමතුලිතතාව බිඳ වැටීම කෙරෙහි මිනිසා විසින් එල්ල කරන අහිතකර බලපෑම් දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 3)

- මෙම සිතියම 3 හා 4 ප්‍රශ්න සඳහා භාවිතා කරන්න.




(3) (i) ලෝක සිතියමේ A, B වශයෙන් නම් කර ඇති මහද්වීප 2ක නම් කරන්න. (ලකුණු 2)

(ii) (a) සිතියමේ ඇට්ලස් කඳු දැක්වෙන අක්ෂරය කුමක් ද?

(b) ගොඩබිමින් සම්පූර්ණයෙන්ම වට වූ හෝ අර්ධ වශයෙන් වට වූ හෝ සාගරවලට සම්බන්ධ වූ කරදිය ප්‍රදේශ හඳුන්වන්නේ කවර නමකින් ද?

(c) සම මුදුනකින් හෝ ආසන්න සමතාවයකින් යුත් මුදුන් සහිත කඳු වලින් වට වූ උස් සම භූමිය හඳුන්වන්නේ කවර නමකින් ද? (ලකුණු 3)

(iii) ගංගා හා විල් මානුෂ ක්‍රියාකාරකම් වලදී වැදගත් වන ආකාරය කරුණු 2ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 5)

(4) (i) ඉහත ලෝක සිතියමේ G, F අක්ෂර වලින් දක්වා ඇති තේ වගා කරන රටවල් 2ක නම් කරන්න. (ලකුණු 2)

(ii) ලෝකයේ වතු කෘෂිකර්මයේ දක්නට ලැබෙන ලක්ෂණ 3ක් දක්වන්න. (ලකුණු 3)

(iii) (a) ශ්‍රී ලංකාවේ තේ වගාව ව්‍යාප්ත වීම කෙරෙහි බලපා ඇති සාධක 2ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(b) ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය ආශ්‍රිත මෑත කාලීන ප්‍රවණතා 2ක් පැහැදිලි කරන්න. (ලකුණු 3)

(5) (i) ලෝකයේ නැව් තැනීමේ කර්මාන්තය සඳහා ප්‍රමුඛත්වය ගන්නා ආසියාතික රටවල් 2ක් නම් කරන්න. (ලකුණු 2)

(ii) වර්තමානයේ නැව් තැනීමේ කර්මාන්තය ආසියානු රටවල ව්‍යාප්තවීමට බලපෑ හේතු 3ක් සඳහන් කරන්න. (ලකුණු 3)

(iii) ශ්‍රී ලංකාවේ බෝට්ටු නිෂ්පාදනය පහත සඳහන් ශීර්ෂ යටතේ විස්තර කරන්න.

(a) ශ්‍රී ලංකාවේ බෝට්ටු නිෂ්පාදනය කරන ප්‍රදේශ 2ක් නම් කරන්න. (ලකුණු 1)

(b) බෝට්ටු නිෂ්පාදනයේ දී මතුව ඇති ගැටලු 2ක් දක්වන්න. (ලකුණු 2)

(c) බෝට්ටු නිෂ්පාදනය ආශ්‍රිත ප්‍රවණතාවක් සඳහන් කරන්න. (ලකුණු 2)


(6) (i) ලෝකයේ පස් නිර්මාණයට බලපාන සාධක 2ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ii) (a) ශ්‍රී ලංකාවේ ප්‍රධාන පස් වර්ග පිහිටා ඇති කලාප 2ක් යාබද සිතියමේ A, B ලෙස ලකුණු කර ඇත. එම පස් වර්ග නම් කරන්න. (ලකුණු 2)

(b) වියළි කලාපයට ආවේනික වූ පස් වර්ගය කුමක් ද? (ලකුණු 1)

(iii) (a) ඛනිජ සම්පත් භාවිතයේ දී මුහුණපාන ගැටලු 2ක් ලියන්න. (ලකුණු 2)

(b) ඛනිජ සම්පත් සංරක්ෂණය සඳහා ගත හැකි පියවර 2ක් පැහැදිලි කරන්න. (ලකුණු 3)




(7) (i) ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන වනාන්තර වර්ග 2ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(ii) (a) ශ්‍රී ලංකාවේ වන රක්ෂිත ලෙස නම් කර ඇති වනාන්තරයක් නම් කරන්න. (ලකුණු 1)

(b) වනාන්තර හා වන ජීවී රක්ෂිතවල ඇති ප්‍රයෝජන 2ක් දක්වන්න. (ලකුණු 2)

(iii) (a) ශ්‍රී ලංකාවේ බලශක්තිය නිපදවීම සඳහා යොදා ගන්නා ශක්ති උත්පාදන 2ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(b) බල ශක්තිය අරපිරිමැස්මෙන් භාවිත කිරීමේ ඇති වැදගත්කම කරුණු 2ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 3)

(8) (i) සංවර්ධනය මැනීම සඳහා යොදා ගන්නා නූතන මිනුම් 2ක් නම් කරන්න. (ලකුණු 2)

(ii) ඔබ සඳහන් කළ එක් දර්ශකයක් ගණනය කිරීම සඳහා යොදා ගන්නා නිර්ණායක මොනවා ද? (ලකුණු 3)

(iii) (a) ශ්‍රී ලංකාවේ මෑත කාලීන සංවර්ධන ක්‍රියාමාර්ගයක් ලෙස මහාමාර්ග සංවර්ධනයේ දී ගෙන ඇති පියවර 2ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(b) ගම හා නගරය අතර පරතරය අඩු කිරීම සඳහා ගෙන ඇති ප්‍රාදේශීය සංවර්ධන ක්‍රියාමාර්ග 2ක් පැහැදිලි කරන්න. (ලකුණු 3)

..ම හිමිකම් ඇවිරිණි
..பதிப்புரிமையுடையது
..ights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

## 11 ශ්‍රේණිය

## භූගෝල විද්‍යාව - II GEOGRAPHY II

../විභාග අංකය :-- ..........................................................................




1 : 50 000